# කඳුකරයේ රහස



පමෝද්‍යා ධනංජනී බණ්ඩාර
4 ශ්‍රේණිය A
මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර

# කඳුකරයේ රහස

**පමෝධ්‍යා ධනංජනී බණ්ඩාර**

# කළුකරයේ රහස

**පමෝධ්‍යා ධනංජනී බණ්ඩාර**
කතෘ

කතෘගේ අනෙකුත් කෘති

| | |
|---|---|
| කිටියාට පාඩමක්... | කවුද හොරා? |
| මම ආසයි ඉගෙනගන්න... | මම තනියෙන් |
| පාට පාට පාට ලෝකේ... | හරි වැඩේ... |
| Rainbow Fairy | what happened? |
| බඩේ අමාරුව | Two donkeys and their Maid |
| මට හරියට වැඩ | |

පාසල : මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර.

ඉගනුම ලබන පංතිය : 4 ශ්‍රේණිය A

කෘතිය පළ කරන දිනය : 2026.05.10

ISBN අංකය : 978-624-211-355-5

•

පිදුම

පෙර පාසලේ ගුරුතුමියන්ට

මගේ පාසලේ ඇදුරුතුමියන්ට

මගේ පාසලේ සොහොයුරියන්ට

මගේ අම්මාට, අප්පච්චීට, මල්ලීට, අත්තාට,

සහ

අත්තම්මාට

බැතියෙන් පුදමි.



## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# <u>සුභාශිංසන පණිවුඩය</u>

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,<br>
දියවඩන නිලමේ,<br>
ශ්‍රී දළදා මාලිගාව<br>
2026.05.10

# කඳු හතරක් තිබුණු රාජධානිය

බොහෝ කාලයකට පෙර කඳු හතරක් තිබුණු රාජධානියක් තිබුණා. ඒ රාජධානියේ ඉස්සර රජ කෙනෙක් හිටියත් මේ කතාව කියන කාලේ නම් රජ කෙනෙක් හිටියේ නැහැ.

එක කන්දක හිටියේ නපුරුම, නපුරු මායාකාරියක්. ඒක මිනිසුන්ගේ රාජධානියට දකුණෙන් පිහිටා තිබුණා.

උතුරු පැත්තෙන් තිබුණු කන්දේ හිටියේ සුරංගනාවියන්ගේ රැජින. එතැනින් දිව්‍ය ලෝකයට පඩිපෙළකුත් තිබුණා. සුරංගනා රැජින රාජධානියේ මැද තිබුණු කන්දේ හිටියා. ඇය මිනිසුන්ට කරදර වූ හැම වෙලාවකම පිහිට වුණා.

යාළුවනේ, අන්තිම කන්ද තිබුණේ මේ කඳු වලින් ඈතට වෙන්න නැගෙනහිර පැත්තෙන්.

මේ කතාව හොඳට තේරුම් ගන්න නම් පොතේ තියෙන සිතියම බලන්න.


N
① සුරංගනා රාජධානිය
② මිනිසුන්ගේ මැද කන්දේ රාජධානිය
③ නැගෙනහිර කන්දේ රාජධානිය
④ දකුණු කන්දේ මායාකාරියගේ වාස භවන.

# මිනිසුන්ගේ රාජධානිය

මැද කන්දේ මිනිසුන්ගේ රාජධානිය පිහිටලා තිබුණා. ඒක විශාල නගරයක්. රජ මාලිගාව වගේම තවත් බලකොටු මාලිගා ගොඩක් මේ නගරයේ තිබුණා.

මේ රාජධානියේ රජතුමා මිය ගිහින් තිබුණ නිසා සිහසුන හිස්වෙලා තිබුණා. බලකොටුවල සිටි ආදිපාදවරු රජකම ගන්න සටන් කළා.

හැමෝම හිටියේ තරහ සහ වෛරය හිතේ තියාගෙන. තවත් වෙලාවට එයාලා කිහිප දෙනෙක් එකට එකතු වෙලා තවත් කෙනෙකුට විරුද්ධවත් සටන් කළා.

ආයෙමත් එයාලා වෙනවෙලා තරහා වුණා. ඒක හැමෝටම හරිම කරදර කාලයක්.



## සුරංගනා රැජිනගේ රාජධානිය

ඒ රාජධානිය ඉතාමත් සාමකාමියි. එයාලා මිනිසුන්ගේ සටන් නවත්වන්න ලොකු උත්සාහයක් ගත්තා.

සටන්වලින් තුවාල වූ අය සුවකරන්න බෙහෙත් හැදුවා. බෙහෙත් හදන්න ගත්තේ එයාලගේ උතුරු කන්දේ තිබුණු පූජනීය ගසේ කොළ.

දැන් නම් ඒවත් අවසන් වෙමින් තමයි යන්නේ...



## දකුණු කන්දේ නපුරු මායාකාරිය

මේ කන්දේ හිටියේ හරිම නපුරු මායාකාරියක්. එයා කලෙකට කලින් මිනිසුන්ගේ රාජධානියේ රජතුමාට උපදෙස් දෙන පුරෝහිතවරිය විදියට සේවය කළා.

ඒත් ඇගේ නපුරු වැඩ නිසා සුරංගනාවන් රජතුමාට පැමිණිලි කරලා, ඇය දකුණු කන්දට එළවා දැමුවා.

එහෙම එළවා දැම්මත් ඇය හැමවිටම මිනිසුන්ගේ රාජධානියේ ආදිපාදවරුන් එකිනෙකා සමඟ සතුරු වන වැඩ කිරීම නැවැත්තුවේ නැහැ.



## නැගෙනහිර කන්දේ කුඩා රාජධානිය

මේ කන්දේ වැඩි කොටසක් තිබුණේ වනාන්තර. ඒ වනාන්තර මැද කුඩා මාලිගාවක් හා ගමක් තිබුණා.

ඒ මාලිගාවේ සිටියේ හරිම බුද්ධිමත්, සාමකාමී හා නිර්භීත ආදිපාදවරියක්. ඇය සුරංගනාවියන්ගේ උපදෙස් ගෞරවයෙන් පිළිගත්තා.

මිනිසුන්ගේ රාජධානියේ නායකත්වය ගන්න හදන ආදිපාදවරුන් ආදිපාදවරිය සමඟ සටන් කළේ නැහැ.

ඒ ගැන මිනිසුන්ගේ රාජධානියේ ආදිපාදවරු හිතුවේ ඇය දුර්වලයි, බයයි, මෝඩයි, අපිව කවදාවත් පරාජය කරන්න ඇයට නොහැකියි කියලා.

නපුරු මායාකාරිය ඇයට කරදර කළත් ඒවා පරාජය කරන්න ඇයට හැමවිටම හැකි වුණා.



## සටන්

කාලය ගෙවිලා ගියා...

නපුරු මායාකාරිය බොරු කියමින් ආදිපාදවරු තව තවත් සටන් කරන්න පෙළඹුවා. මෝඩ ආදිපාදවරු දිගටම සටන් කලා ජීවිත නැති වුණා. තුවාලකරුවන් වැඩිවුණා. නොනවත්වාම බෙහෙත් හැදුව නිසා සුරංගනාවියන්ට බෙහෙත් හදන්න, පූජනිය ගසේ කොළ සියල්ල අවසන් වුණා.



## නපුරු මායාකාරියගේ උපදෙස්

නපුරු මායාකාරිය, යුධ කරන්න මෝඩ ආදිපදවරුන්ට දිගටම උපදෙස් දුන්නා. ආදිපාදවරු සුරංගනාවියන්ගේ උපදෙස් පිළිගත්තේම නැහැ. බෙහෙත් නැති වුණා තුවාල වුණ අය බොහෝ දෙනා මිය ගියා. වෙන කිසිම වැඩක් නොකර සටන් කරන නිසා කෑම බීමත් හොඳටම හිඟ වුණා. වගා පාළු වුණා, ලෙඩ රෝග වැඩි වුණා. බඩගින්නත් කෑම හිඟයත් ලොකු ගැටළුවක් වුණා.



**මායාකාරිය හොර රහසේම කන්දට පැන ගියා.**

මායාකාරිය හොර රහසේම ආදිපාදවරුන්ගේ අවසන් කෑම ටිකත් රැගෙන ඇගේ කන්දට පැන ගියා.



## සුරංගනාවියන්ගේ උදවු

දැන් ආදිපාදවරුන්ට උදව්වට කවුරුත් නෑ. ඔවුන් සුරංගනාවියන්ට පණිවුඩ යවා උදවු ඉල්ලුවා. එත්, සුරංගනාවියන්ට උදවු කරන්න ක්‍රමයක් තිබුණේ නැහැ,

ආදිපාදවරුනි ඔබලා නැගෙනහිර ආදිපාදතුමියගෙන් උදවු ඉල්ලන්න, දැන් අපට උබලාට උදවු කරන්න කිසිම විදියක් නැහැ කරුණාකර ඇය හමුවෙන්න සුරංගනාවන් කිව්වා.

අකමැත්තෙන්ම ආදිපාදවරු ආපසු ගියා.



## ආදිපාදවරියගේ උදව් ඉල්ලන්න යාම

කොහොම වුනත්, ආදිපාදවරිය හමුවෙන්න ඔවුන් භය වුණා. ඈය අපට කෙසේ සලකාවිද? ආදිපාදවරු සිතුවා.

ආදිපාදවරු කවඩාවත් ඈයට ඔවුන්ගේ නගරයේ සාදවලට ආරාධනා කළේ නැහැ. සටන් වලට ඈය එන්නෙ නැති නිසා ඈයට දොස් කියලා, තර්ජනය කරලා උසුළු විසුළු කරල ලියුන් යවලත් තියනවා.

ඇත්තටම ඈය ඔවුන් කොහොම පිළිගනීවිද මටත් සැකයි!.



## ආදිපාදවරියගේ උදව් ඉල්ලන්න යාම

කාලෙ ගෙවිලා ගියා ආදිපාදවරුන්ට ලැජ්ජවට වඩා බඩගින්න වැඩිවුණා.

ඔවුන් ඔක්කොම එකතුවෙලා නැගෙනහිරට ගියා උදව් ඉල්ලන්න, ආදිපාදතුමියගෙන්.

නැගෙනහිරට යනකොට දවස් ගනණක් යනවා. වනාන්තර ඇතුළේ රෑ කිහිපයක්ම ගත කරන්නත් වෙනවා. එත් එයාලා ඒ ගමන ගියා. පළමු දවස ගෙවුනා. රෑ බෝවුණා. ආදිපාදවරු වනයේ නැවතී ගිමන් හරින්න වුණා.

ඈතින් පන්දම් ගත් පිරිසක් එනවා ඔවුන් දැක්කා. ඔවුන්ට හරිම වෙහෙසයි, සටන් කරන්න නම් කිසිම ශක්තියක් නෑ. ඔවුන් සතුරන් නම් අපි යටත්වෙමු! ඔක්කෝම දුකෙන් කිව්වා.

ඒ පිරිස හොඳටම ළං වුණා.



## ආදිපාදවරියගේ උදව් ඉල්ලන්න යාම

හරි පුදුමයක්!

ඒ ආදිපාදතුමිය! ආදිපාදවරු ඔක්කොම පුදුමයටත් කලබලයටත් පත්වුණා. ඈය සන්සුව සෙබළුන්ට අණ කළේ ආදිපාදවරුටත් ඔවුන්ගේ පිරිසටත්, අශ්වයන්ටත් කෑම-බීම බොන්න වතුරත් දෙන්න.

ආදිපාදතුමිය, ආදිපාදවරු ඔක්කෝම ඇගේ රාජධානියට සාදරයෙන් පිළිගන්නා බව ඔවුන්ට කිව්වා.

ඉන්පසු, ඈය මාලිගාවට පිටත්ව ගියා. ආදිපාදතුමියගේ සෙබළු ආදිපාදවරු හා පිරිස නැගෙනහිර රාජධානියේ මාලිගයට කැඳවාගෙන ගියා.



## ආදිපාදවරියගේ උදව් ඉල්ලන්න යාම

පසුදා උදෑසනම ආදිපාදවරු ආදිපාදවරිය මුණ ගැසුනා. ආදිපාදවරු ඔවුන් මුහුණ දුන් ප්‍රශනය ආදිපාදවරියට කිව්වා.

ඇය උදව් කරන්න කැමති වුණා. ඒත් එක ඉල්ලීමක් ඉටුකරනවා නම් පමණයි. මම ඔබලාට උදව් කරනවා, ඔබලා අතර සටන් නවත්තන්න ඕනෑ පළමුවෙන්ම.

ඔබලා අතරින් වැඩිමහල් හා පළපුරුදු ආදිපාදවරයා රජකමට පත් කරන්න. ඔබලා මා හමුවෙන්න එකට එක් මග ආවා වගේම සමගියෙන් සිටියොත් ගැටලුව ඉවරයි ඇය කිව්වා.



## ආදිපාදවරියගේ උදව් ඉල්ලන්න යාම

තවත් කෑම බීම හා උදව්වට පිරිස් රැගෙන මිනිසුන්ගේ රාජධානිය වෙත තව ටික දවසකින් පැමිනෙණ බව දන්වා ආදිපාදවරිය ඔවුන්ට සමු දුන්නා.

සියළු දෙනාම ආදිපාදවරියට ස්තුති කර ආපසු ඔවුන්ගේ රාජධානිය වෙත ගියා. අකමැත්තෙන් වුවත් ආදිපාදවරිය කියූ ආකාරයට වැඩකරන්න පළමුවෙන්ම, ඔවුන් රැස්වීමක් පැවැත්වූවා.

කවුද වැඩිමල්,

ඔන්න තවත් ගැටළුවක්!

ආයෙත් සටන් පටන් ගත්තා. තුවාල වෙන අයට බෙහෙත් නොතිබුණ නිසා ඔවුන් බොහෝමයක් මිය ගියා. සටන් නිසා නැගෙනහිරෙන් ගෙනා කෑම බීමත් විනාස වුණා.

ඔන්න, ටික දිනකින් ආදිපාදවරිය මේ නගරයට ආවා. ඇය මේ සියල්ල දුටුවා.

ඒ වුණත් තුවාල කරුවන්ට උදව් කරන්න ඇයට ඕනෑ වුණා. ඇය ආ නිසා මදකට සටන් නැවැත්වූ ආදිපාදවරු ඇය හමුවුණා. මා ගෙනා උදව් ඔබලාට ඕනෑ නම් මා සමග තුවාල කරුවන්ට බෙහෙත් ලබාගැනීමට උතුරේ සුරංගනාවියන් හමුවෙන්න යන්න එන්න. ඇය කිව්වා.

එයට සියළු දෙනා එකඟ වුණා.

## උතුරේ සුරංගනාවියන්ගේ උදව් ඉල්ලන්න යාම

සියළු දෙනාම උතුරු රාජධානියට යනවිට ඔවුන්ගේ රැජිනත් තවත් කිහිප දෙනෙකුත් හැරෙන්නට කිසිවෙක් සිටියේ නෑ.

පිරිස පුදුම වූ නිසා රැජින හේතුව පැහැදිලි කලා. අපේ පිරිස ඔබලා ගැන හොඳටම කළකිරීම නිසා දෙව්ලොවට ආපසු ගියා. ඔසු පිණිසම ලබා දී පූජනීය ගසේ පත්‍ර සියල්ලමත් අවසන් එය මිය යන්න ඉතා ආසන්නයි.

ඔබේ ප්‍රශ්න විසඳීමට අපට දැන් කිසිවක් කළ නොහැකියි.

ඇය කීවාය.

කවුරුත් කතා නොකරන නිසා. ආදිපාදතුමිය ඉදිරිපත් වී මෙසේ කිවා.

අනේ රැජිනියනි අපි අපේ වරද නිවැරදි කරගන්නම් පූජනීය ගස සුවපත් කළ හැකි ක්‍රමයක් අපට කියා දෙන්න ඇය ඇවිටිලි කළාය.

අවසානයේ, ඇයට අනුකම්පා කල රැජින මෙසේ කීවා.

එහෙනම් උත්සහ කරන්න ගස සුවපත් කරන්න වගේම ඔබට වඩාත් සුදුසු රජ කෙනෙක් පත් කරගන්නත්.

එහෙනම්, ඔබලා ළඟ බුද්ධිය හා කරුණාව දෙකම තියන කෙනෙක් ඇවිත් මේ ගසට දිය බඳුනක් දමන්න, එවිට ඒ කෙනා බුද්ධිය හා කරුනාව දෙකම තිබෙන කෙනෙක් නම් පූජනීය ගස අලුතෙන් දළු දමාවි. එවිට ඒ කෙනාම අපට රජකමටත් පත් කරගන්න පුළුවන්.

## උතුරේ සුරංගනාවියන්ගේ උදව් ඉල්ලන්න යාම

එහෙම කියනවාත් එක්කම ආදිපාදවරු සියළු දෙනාම දිය බඳුන් ගෙන්න එහේ මෙහේ දුවන්න ගත්තා. කලබල නොවූ ආදිපාදවරිය තම වාරය පැමිනෙණ තෙක් ඉවසීමෙන් බලා සිටියා. ආදිපාදවරු සියළු දෙනාම දිය වත් කෙරුවත් ගස කිසිම වෙනසක් පෙන්වූයේ නෑ. ඔවුන් කතා වුණෝ, ඔවුන් ළඟ ඒ හොඳ ගති දෙකම තිබුණත් ගස මේ වෙද්දිත් මිය ගිහින් තිබූ නිසා පලක් නෑ කියලයි.

ඒත් සුරංගනා රැජින සියළු දෙනාටම කිව්වේ , ඔබලා සියලුම දෙනාටම අවස්ථාව ලබා දුන්නද?

තවත් එක් අයෙක් සිටිනවා ඇයට අවස්තාවක් දෙන්න. ඇය ආදිපාදවරිය වෙත අත දිගුකර කීවාය.

උත්සහ කරන්න ඇය නැවත වරක් කීවාය.

ආදිපාදවරිය දිය බඳුනක් වත් කරනවාත් සමගම පූජනීය ගසේ දළු ඉක්මනින් හටගන්නට පටන්ගත්තා. සියලුදෙනාම පුදුමයට පත්වුණා.

රැජිනට ස්තුති කළ ආදිපාදවරිය අනෙක් සුරංගනාවන්ගේ උදව්වෙන් තුවාල කරුවනට බෙහෙත් හදන්න පටන්ගත්ත.

## රජකම ආදිපාදවරියට

ආදිපාදවරු මෙයින් පසු තමන් ගැන ලැජ්ජාවට පත්වුණා ආදිපාදවරියට ස්තුති කළා. එසේම රජකම ඇයට ලබා දෙන්නත් කටයුතු කළා. සටන් නැති නිසා ඔවුන් වැඩි කාලයක් බෝග වගා කරන්නත් සතුටින් සමගියෙන් ජීවත් වෙන්නත් ආරම්භ කළා.

නපුරු මන්තර කාරිය ආයෙත් ඇවිත් එක එක බොරු කිව්වත් ඇයව විශ්වාසයට නොගෙන පළවා හරින්නත් ඔවුන් පුරුදුවුනා.



## නපුරු මායාකාරියගේ උපදෙස් විශ්වාසයට නොගෙනීම

නපුරු මන්තර කාරිය ආයෙත් ඇවිත් එක එක බොරු කිව්වත් ඇයව විශ්වාසයට නොගෙන පළවා හරින්නත් ඔවුන් පුරුදුවුනා.

දැන් අලුත් රජින ඉස්සර වගේම සරලව සාමකාමීව ජීවත් වුනා

## අපට ඉගන්න තියෙන පාඩම

ඉතින් යාලුවනේ,

මේ කතවෙන් අපට ඉගන්න තියෙන පාඩම තමයි. අපට කොතෙකුත් අපහාස තර්ජන භාධා ආවත් අපේ හොඳ ගති දිගටම පවත්වාගෙන යන්නත්, සියළු දෙනාගේ යහපත් වෙනුවෙන් ඉදිරිපත් වෙන්නත්, වගේම අපට කරදර කරපු අයට වුනත් විපතක් වුණාම උදව් කරන්නත් ඕනෑ. එහෙම වැඩ කළාම, කවදා හෝ දිනක අපට ජය ගන්න හැකිවෙනවා කියන එකයි.



**පමෝධ්‍යා ධනංජනී බණ්ඩාර**

## පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බොහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් විසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදී ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලමේ තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සත්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

978-624-211-355-5